# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2119/13 – 2019 අප්‍රේල් 18 වැනි බ්‍රහස්පතින්දා – 2019.04.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2017/77

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.03.20 දිනැති හා අංක 2063/22 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.03.14 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් රත්නපුර, බඩු ගබඩාව පාර, අංක 106 හි පදිංචි එම්. ජී. එස්. පද්මිණී මිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.03.08 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,<br>
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 අප්‍රේල් මස 03 වැනි දින,<br>
කම්කරු දෙපාර්තමේන්තුව,<br>
කොළඹ 05.


1A – G 29899 – 13 (2019/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යොමු අංකය: IR/COM/02/2017/77

**කාර්මික අධිකරණයේ දී ය.**

එම්. ජී. එස්. පද්මිණී මිය,
අංක 106,
බඩුගබඩාව පාර,
රත්නපුර.

(ඉල්ලුම්කාරිය)

නඩු අංකය : ඒ/16/2018

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

(වගඋත්තරකරු)

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මැතිතුමා 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මහනුවර, හෙද පුහුණු පාසල, විදුහල්පති නිල නිවස, එල්. ආර්. සුමතිපාල වන මා 2018.03.14 වැනි දින පත්කොට මෙම ආරාවුල මා වෙත යොමුකොට ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පැවැති කරුණු වූයේ –

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2013.07.05 වැනි දින හෝ ආසන්න දිනක සිට විනය විභාග නිලධාරි තනතුරේ රාජකාරි ආවරණය කිරීමේ පදනම් මත සේවයේ යොදවා සිටින එම්. ජී. එස්. පද්මිණී යන අය 2013.07.05 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි විනය විභාග නිලධාරි තනතුරේ ස්ථිර නොකිරීම මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න සහ එසේ තිබේ නම් ඇයට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.''

ඒ අනුව පාර්ශවයන් අතර පවත්නා කාර්මික ආරවුල සම්බන්ධයෙන් දෙපාර්ශවය වෙතින් ම ලිඛිත කරුණු දැක්වීමෙන් අනතුරුව නඩුව විභාගයට ගැනීමට තීරණය කරන ලදී. එහිදී පැමිණිලිකාර පාර්ශවය සමථ යෝජනාවක් ඉදිරිපත් කළ අතර, ඊට වගඋත්තරකාර පාර්ශවය ප්‍රතිචාර දැක්වීම ප්‍රමාද වූයෙන් නිශ්චිත පිළිතුරක් ලැබෙන තෙක් හෝ එය ප්‍රතික්ෂේප කරන තෙක් හෝ නඩුව අඛණ්ඩව විභාගයට ගැනීමට තීරණය කරන ලදී. එකී තීරණය පරිදි නඩුව විභාග වෙමින් පවතින අවස්ථාවේ දී එනම් වර්ෂ 2018.11.13 වැනි දින නැවත පැමිණිල්ලේ සමථ යෝජනාව සම්බන්ධ ව වගඋත්තරකාර පාර්ශවය කරුණු දක්වමින් ඉල්ලුම්කරු 2018.11.09 වැනි දින සිට පසු වැටුප් රහිතව V වන ශ්‍රේණියේ විනය විභාග නිලධාරී තනතුරේ ස්ථිර කිරීමට එකඟතාවය පළ කරන ලදී.

ඊට ප්‍රතිචාර දක්වමින් ඉල්ලුම්කාරිය ප්‍රකාශ කර සිටියේ විශ්‍රාම යාමේ දී V වන ශ්‍රේණියේ නිලධාරිණියකට හිමිවිය යුතු මාස තුනක විශ්‍රාම පූර්ව නිවාඩුව ද එකී සමථයකට ඇතුළත් කරමින් එය ලබා දෙන්නේ නම් තමන් ඊට එකඟ වන බවය. වග උත්තරකාර පාර්ශවය ඊට ද එකඟ වූයෙන් නඩුව අවසන් කරන ලදී. ඒ අනුව 2018.11.09 වැනි දින සිට ඉල්ලුම්කාරිය V වන ශ්‍රේණියේ විනය විභාග නිලධාරි තනතුරෙහි ස්ථිර කරන ලෙසත් ඇය විශ්‍රාම යන අවස්ථාවේ දී මාස තුනක විශ්‍රාම පූර්ව නිවාඩුවට ඇය හිමිකම් කිව යුතු බවටත් ඊට අමතරව එකී තනතුරෙහි පිහිටුවීම මත ඉල්ලුම්කාරියට කිසියම් හිඟ වැටුපක් හිමි වේ නම් එම හිඟ වැටුප ද ලැබීමට ඇය හිමිකම් ලබන බවටත් අධිකරණයේ ප්‍රදානය විය. ඇයට එසේ හිඟ වැටුපක් පිළිබඳ හිමිකම් තිබේ ද යන්න පිළිබඳව අධිකරණයේ අවධානය යොමු වූ අතර, ඒ වන විට ඇය අදාළ වැටුප් පියවරයන් ලබා තිබීම මත හිඟ වැටුපක් නොමැති බවට පාර්ශවයන් එකඟත්වය පළ කරන ලදී.

එහෙයින් මෙම සමථය සාධාරණ වූත්, යුක්ති සහගත වූත් එකක් බවට තීරණය කරමි.

2019 මාර්තු මස 08 වැනි දින දී ය.

එල්. ආර්. සුමතිපාල.
බේරුම්කරු.

05 - 37

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.